# VI කොටස: කොන්ත්‍රාත් ගිවිසුම
# Section VI: Contract Agreement

අංක. ...........

<u>පාර්ලිමේන්තුවට ආහාර ද්‍රව්‍ය සැපයීම – 2026/2027</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ (මෙහි මින්පසුව "ගැනුම්කරු" ලෙස හඳුන්වනු ලබන) නොහොත් එම පාර්ලිමේන්තු මහ ලේකම් ද ඇතුළුව, සන්දර්භය තුළදී අවශ්‍ය ලෙස ඔහුගේ අනුප්‍රාප්තිකයන්, එම කාර්යාලයේ පැවරුම්කරුවන් සහ දැනට කාර්යාලයේ කටයුතු කරන නිලධාරීන් ලෙස අර්ථ දැක්විය හැකි අය "පළමු පාර්ශ්වය" ලෙස ද,

සහ,

............................................................ (සමාගමේ නම) ලෙස නම් වන, ලියාපදිංචි කිරීමේ අංක (……………) සහිතව සමාගම් පනත යටතේ නිසි පරිදි සංස්ථාගත කර ඇති සමාගමක් සහ එහි ලියාපදිංචි කාර්යාලය, පෙර සඳහන් ජනරජයේ ,…………................................................ යන ලිපිනයේ පිහිටි, (මෙහි මින්පසුව "කොන්ත්‍රාත්කරු" ලෙස හඳුන්වනු ලබන) මෙහි භාවිතා වන පදය හෝ ප්‍රකාශනය සන්දර්භය විසින් අවශ්‍ය කරන හෝ පිළිගන්නා අවස්ථාවන්හිදී එම ................................................ (සමාගම් නාමය), එහි අනුප්‍රාප්තිකයන්, ක්‍රියාත්මක කරන්නන් හෝ අවසර ලත් පැවරුම්කරුවන් "දෙවන පාර්ශ්වය" ලෙසද සලකා,

එම පාර්ශව අතර ගිවිසුම් කොටගෙන,
පහත උපලේඛනයේ වඩාත් විස්තර කර ඇති "පාර්ලිමේන්තුවට ආහාර ද්‍රව්‍ය සැපයීම - 2026/2027" ගැනුම්කරු විසින් "කොන්ත්‍රාත්කරුට" ප්‍රදානය කිරීමට එකඟ වී ඇති අතර, "කොන්ත්‍රාත්කරු" එම උපලේඛනයේ දක්වා ඇති මිල ගණන් (මෙහි මින්පසුව "කොන්ත්‍රාත්තුවේ මිල" ලෙස හඳුන්වනු ලබන) අනුව කොන්ත්‍රාත්තුව පිළිගෙන ඇති හෙයින්, දැන් තත් පාර්ශවයන් විසින් සහ අතර මෙහි පහත දැක්වෙන පරිදි වර්ෂ 2026 …......... මස ….... වන දින ප්‍රකාශකොට ගිවිසගත්තෝ වෙමු.

මෙම ගිවිසුම පහත පරිදි වේ: -

1. මෙම ගිවිසුමේ සඳහන් වචන සහ ප්‍රකාශනවල අර්ථයන්, ඒවාට මෙම ගිවිසුමේම කොටසක් වන, කොන්ත්‍රාත්තුවේ " ලංසුකරුවන්ට උපදෙස් " (ITB) හි දක්වා ඇති පරිදි වන්නේය.
2. මෙම ලේඛනයේ පහතින් දක්වා ඇති උපලේඛනයේ දක්වා ඇති අනිකුත් ලේඛන මෙම ගිවිසුමෙහිම කොටසක් ලෙස කියවා තේරුම් ගත යුතු ලෙස පිහිටුවා ඇත.
3. කොන්ත්‍රාත්කරුවා විසින්, මිල සටහනේ දක්වා ඇති පරිදි , ඉහත ලංසුවේ ලංසුකරුවන්ට උපදෙස් (ITB) කොටසේ වඩාත් සම්පූර්ණයෙන් විස්තර කොට ඇති විධිවිධාන වලට අනුකූලව, සඳහන් කොට ඇති "කොන්ත්‍රාත්තුවේ මිලට", කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කළ යුතුය.
4. මෙම කොන්ත්‍රාත්තු ගිවිසුම් ලේඛනය, මීට සම්බන්ධ අනෙකුත් සියලු ලේඛන අභිබවා බලාත්මක වේ. කොන්ත්‍රාත් ලේඛනවල කිසියම් විෂමතාවයක් හෝ නොගැලපීමක් ඇති වුවහොත්, සටහනේ ලැයිස්තුගත කර ඇති අනුපිළිවෙලෙහි ලේඛන බලාත්මක වනු ඇත.
5. මෙහි පෙර සඳහන් කළ පරිදි ගැනුම්කරු විසින් කොන්ත්‍රාත්කරුවා වෙත ගෙවිය යුතු කොන්ත්‍රාත්තුවේ මිළ මත, ඉහත සඳහන් සේවාව සැපයීමටත්, එහි අඩුලුහුඩුකම් පූරණයටත්, ගිවිසුමේ විධිවිධානවලට අනුකූලව, කොන්ත්‍රාත්තුකරුවා ගැනුම්කරුවා සමඟ බැඳී සිටී.
6. ඉහත කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීම සැලකිල්ලට ගනිමින් ගැනුම්කරු, කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත් මිල, මෙම ගිවිසුමේ ලංසුකරුවන්ට උපදෙස් (ITB) විසින් විස්තර කර ඇති ආකාරයට ගෙවිය යුතුය.
7. කොන්ත්‍රාත්කරු විසින් මෙම ගිවිසුම විධිමත්ව කලට වේලාවට ක්‍රියාත්මක කරනු ලබන බවටද, මෙම ගිවිසුමේ නියමයන් කිසිවක් උල්ලංඝනය කරනු ලැබුවහොත් ඒ සඳහා ඇපයක් වශයෙන් අංක ………….. සහ ……………… දින දරන බැංකු ඇපකරයේ රුපියල් ………………. ක මුදලක් තැන්පත් කරන ලද බවත්, මෙම ගිවිසුම සම්බන්ධයෙන් එම මුදල තමන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත උගස්කොට පවරා දෙන්නට යෙදුන බවත්, කොන්ත්‍රාත්කරු පිළිගනී.

ඉහත සඳහන් සියල්ලටම සාක්ෂි වශයෙන් මෙහි ඉහත සඳහන් කර ඇති දිනයේදී සහ වර්ෂයේදී යථෝක්ත පාර්ශවයන් විසින් ඔවුනොවුන්ගේ පොදු නිල මුද්‍රා සහ අත්සන් මෙහි තබන ලදි.

***<u>පළමු කොටසෙහි පක්ෂය</u>***

අත්සන : .......................................

නම : ..........................................................

තනතුර : ..........................................................

ලිපිනය : ..............................................................................

..............................................................................

<u>සාක්ෂිකරුවන්</u>

(1) අත්සන: .......................................
නම : .......................................
ලිපිනය: .......................................

(2) අත්සන: ..........................................
නම : ..........................................
ලිපිනය: ..........................................

***<u>දෙවන කොටසෙහි පක්ෂය</u>***

අත්සන : ..........................................

නම : .......................................……………………

තනතුර : ......................................................................

ලිපිනය : .......................................................................................................

.......................................................................................................

<u>සාක්ෂිකරුවන්</u>

(1) අත්සන : .......................................
නම : ..........................................
ජා.හැ.අං : ……....................................
ලිපිනය : ..........................................
..........................................

(2) අත්සන : ............................................
නම : ............................................
ජා. හැ. අං: ............................................
ලිපිනය: ..............................................
..............................................

<u>ඉහත සඳහන් උපලේඛනය:</u>

ඉහත දක්වා ඇති කොන්ත්‍රාත්තුව පහත ලේඛන වල සම්පූර්ණයෙන් විස්තර කොට ඇත.

1. ලංසුකරුවන් සඳහා උපදෙස් - I කොටස
2. දත්ත පත්‍රිකාව - II කොටස
3. මිල සටහන - III කොටස
4. ලංසු (මිල ගණන්) ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රය - V වන කොටස
5. සේවා යෝජකයාගේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ ලිපිය
6. කාර්ය සාධන සුරක්ෂණය - VIII කොටස
7. ඔබගේ වෙනත් ලියකියවිලි ඇත්නම් කරුණාකර සඳහන් කරන්න